# අද්භූත මායා තොප්පිය



# අද්භූත මායා තොප්පිය

ආර්.එම්.සඳලි තාරකා රත්නායක

අද්භූත මායා තොප්පිය

ආර්.එම්.සඳලි තාරකා රත්නායක

ISBN අංකය - 978-624-208-022-2

මුද්‍රණය - සඳලි තාරකා රත්නායක

පිටකවරය - සඳලි තාරකා රත්නායක

2023 නොවැම්බර් 15

# පිදුම

මාගේ ආදරණීය දෙමාපියන්ටත් ,

ගුරුභවතුන්ටත් , මිතුරු මිතුරියන්ටත් ,

සහෝදර සහෝදරියන්ටත්

ආදරයෙන් පුදමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ  ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනා ගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලිඛිත අංකුර දහස් ගනණක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අද්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට  සිහිනදකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අද්දැකීම් ඉදිරි අනාගතයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමණාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාන්ගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

ඔන්න එකමත් එක කාලෙක කුඩා ගමක පුංචි පවුලක් ජීවත් වුණා.ඒ පවුලේ අම්මයි, තාත්තයි, ශ්‍රේඩියල් කියලා පුංචි ළමයෙකුයි තමයි ජීවත් වුණේ.එයාලා හරිම දුප්පත්.ගමේ හිටපු දුප්පත්ම පවුල තමයි මේ පුංචි පවුල.එයාල ජීවත් වුණේ කොහු ලණු හදලයි.ඉතින් මේ පවුල ගොඩක් දුප්පත් නිසා ගමේ මිනිස්සු එයාලා ගමේ ජීවත් වෙනවට කැමති වුණේ නෑ.ඉතින් දවසක් ගමේ මිනිසුන් එකතු වෙලා මේ පුංචි පවුල ගමෙන් යවන්න තීරණය කළා.ඒ වෙනකොට ශ්‍රේඩියල්ට වයස අවුරුදු දෙකයි.ශ්‍රේඩියල්ගේ අම්මයි තාත්තයි තීරණය කලා ගමෙන් ඈතට ගොස් ගෙයක් හදාගෙන ජීවත් වෙන්න.ඊට පස්සේ ඔවුන් ශ්‍රේඩියල්වත් අරගෙන යන්න ගියා.



මේ පවුල කැලැව තුල කුඩා පැල්පතක් හදා ගත්තා.ග්‍රේඩියල් ටිකෙන් ටික ලොකු වුණා.එයාගේ තාත්තා පවුල පෝෂණය කරන්න කැලේට ගොස් එළවලු පලතුරු රැගෙන ආවා.ග්‍රේඩියල් තව තවත් ලොකු වුණා.දැන් එයාට අවුරුදු පහයි.එක දවසක් එයාගෙ අම්මා හදිස්සියේම අසනීප වුණා.එයාට ගොඩක් අමාරු වුණා.ටික දවසකට පස්සේ ග්‍රේඩියල්ගේ මව මරණයට පත් වුණා.එයයි එයාගේ තාත්තයි ගොඩාක් දුක් වුණා.ඒ දෙන්නා තනි වුණා.ග්‍රේඩියල් තව තවත් ලොකු වුණා.දැන් එයා අවුරුදු දාහතරක හැදුණු වැඩුණු පිරිමි ළමයෙක්.දිනක් ග්‍රේඩියල් දර සෙවීමට කැලයට ගියා.දර ගොඩක් හොයපු නිසා ඔහුට මහන්සියක් දැනුණා.එයා රූස්ස ගස් සෙවනේ ගිමන් හරින්නට වුණා.ටික වෙලාවකින් එයාට ගෙරවුම් හඬක් ඇසුණා.ඒ සද්දෙට ග්‍රේඩියල්බයවෙලා ඇහැරුණා.



එයා වටපිට බැලුවා.කවුරුවත් පේන්න හිටියේ නෑ.එක පාරටම මහ විශාල සිංහයෙක් ග්‍රේඩියල්ගේ ඇඟට පැන්නා.එයා “බේරගන්න...බේරගන්න” කියලා මහ හයියෙන් කෑ ගැහුවා.ඔහු කීප සැරයක්ම කෑ ගැහුවා.කැලෑවේ විශාල ගුහාවක හිටිය නපුරු මායාකාරයෙක්ට ඒ හඬ ඇහුණා.මායාකරු ඉක්මනින්ම දඩයක්කරුවෙකු ලෙස වෙස් වලාගෙන ග්‍රේඩියල් ළඟට පැමිණ සිංහයාව එළවා දැමුවා.ග්‍රේඩියල් දඩයක්කරුට ස්තූති කරපිටත් වීමට සූදානම් වුණා.එක පාරටම මහ වැස්සක් ඇද හැලුණා.ග්‍රේඩියල්ට වැස්සෙන් බේරෙන්න කිසිම දෙයක් තිබුණේ නෑ. දඩයක්කරු ග්‍රේඩියල්ට තොප්පියක් දුන්නා.



ශ්‍රේඩියල් එය දමාගෙන ගෙදරට දිව ගියා.වටපිටාව අඳුරු නිසා ඔහු කාමරයට ගියා.මහන්සිය නිසාම ඔහුට ඉක්මනටම නින්ද ගියා.එයා අමුතු හීනයක් දැක්කා."දඩයක්කරු දුන් තොප්පිය අහසේ පාවුණා.'හ…හ…හහා' තොප්පිය හිනා වුණා.එය කැලය තුලට ගියා.




ශ්‍රේඩියල් හොඳටම බයවෙලා නින්දෙන් ඇහැරුණා.එයා ළඟ තොප්පිය තිබුණේ නෑ.එයා එළියට ගියා.තොප්පිය අහසේ පාවෙමින් තිබුණා. ශ්‍රේඩියල්ට එයා දුටු සිහිනය මතක් වුණා.තොප්පිය කැලෑව ඇතුළට ගියා.ශ්‍රේඩියල් ඒ පසුපස ගියා.තොප්පිය ගුහාවකට

ගියා.තොප්පිය දඩයක්කරු අතට ගියා.එකපාරටම දඩයක්කරු මායාකරු බවට පත් වුණා.ග්‍රේඩියල් හොඳටම බය වුණා.මායාකරුග්‍රේඩියල්ව මායා ලෝකයකට රැගෙන ගියා.



"පුංචි කොල්ලෝ.... ඔයා මට සේවය කරන්න ඕන.නැත්නම් මම ඔයාව මරා දමනවා"යැයි මායාකරු පැවසුවා.ග්‍රේඩියල් එය පිළිගත්තේ නෑ. මායාකරු ග්‍රේඩියල්ව සිර කූඩුවක් ඇතුළට දමා සිර කලා.කාලයක් ගත වුණා.ග්‍රේඩියල්ගේ පියා කැළය පුරාම ඔහුව සෙවුවා.ඒත් හමුවුනේ නෑ.ඔහු හොඳටම දුක් වුණා.ඔහු

හඬා වැළපුණා.එක දවසක් ලස්සන සුරංගනාවියක් ග්‍රේඩියල්ව සිර කරලා තියෙනවා දැක්කා.



ඇය ග්‍රේඩියල් ලගට ගියා.ග්‍රේඩියල් තමාට සිදුවූ සියල්ලක්ම සුරංගනාවියට කිවුවා.සුරංගනාවිය ග්‍රේඩියල්ව බේරා ගත්තා.ඒ දෙන්නා එකතු වෙලා නපුරු මායාකාරයාව සහ මායා තොප්පිය විනාශ කර දැමුවා.ඊට පස්සේ ඒ දෙන්නා නැවතත් තමාගේ ලෝකයට පැමිණියා.



එයාලා ශ්‍රේඩියල්ගේ ගෙදරට ගියා.ශ්‍රේඩියල්ගේ තාත්තා ගොඩක් දුකෙනුයි හිටියේ.ඔහුශ්‍රේඩියල්ව දැකලා ගොඩාක් සතුටු වුණා.තාත්තා ඒ දෙන්නාව සාදරයෙන් පිළිගත්තා.ශ්‍රේඩියල් තමාට සිදුවූ සියල්ලක්ම තාත්තාට පැවසුවා.තම පුතාගේ වීර ක්‍රියාව අසා ඔහු තවත් සතුටු වුණා.ඔහු සුරංගනාවියට ගොඩක් ස්තූති කළා.



සුරංගනාවියත් ගොඩක් සතුටු වුණා.ඇය ඔවුන්ට ආහාර පාන,ඇඳුම් පැළඳුම් ලබා දුන්නා.ඉන් පසුව සුරංගනාවි එයාලාගෙන් සමු අරන් නැවතත් තමාගේ ලෝකයට ගියා.ඊට පස්සේ ග්‍රේඩියලුයි එයාගේ තාත්තායි සතුටින් කාලය ගත කලා.........!

# නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍යය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය.පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් සමග එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම කෘතිය දරුවන්ට අද්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිරුමාණ රටේ අධ්‍යාපන දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු විමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ නිර්මාපක

2023 . 11 . 01